**මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**--------------------------------**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**-------------------**

1. මූල්‍ය ප්‍රකාශන.

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2015 දෙසැම්බර් 31 දිනට මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සදහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් සභාව මගින් ණය පදනම මත ලබාදී තිබූ කැබ් රථයේ සමාලෝචිත වර්ෂයේ ණය වාරික වශයෙන් ගෙවා තිබූ රු.1,059,409 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) මීනුවන්ගොඩ හා උඩුගම්පොළ උප කාර්යාල මගින් නඩත්තු කරනු ලබන ජල ගාස්තු ලේඛණයන්ට අනුව සමාලෝචිත වර්ෂයේ ජල ගාස්තු ලැබීම් වටිනාකම රු.356,975 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව ලැබීම් රු.365,875 ක් වූයෙන් රු.8,900 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) ආසියානු සංවර්ධන බැංකු පළමු ණය ව්‍යාපෘතිය යටතේ ණය වාරික ගෙවීමේදී ණය මුදල හා පොළිය වශයෙන් එකතුව රු.739,770 ක් ගෙවනු ලබන අතර, 2013 වර්ෂයේ දෙවරක් ගෙවූ එම මුදල 2015 වර්ෂයේ නිවැරදි කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ගෙවූ වියදමක් ලෙස ඇතුලත් කර නොතිබුණි.

(ඈ) ආසියානු සංවර්ධන බැංකු දෙවන ණය ගෙවීම් යටතේ ණය ගෙවීමේදී මාස 04 ක පොලී මුදල වන රු.476,664 ක් පොලී ගිණුමට වැය බරක් නොකර සැපයුම් හා උපකරණ (වෙනත්) ගිණුමට හර කර තිබුණි.

(ඉ) කර්මාන්ත නිම කිරීම සඳහා ලබා දුන් සියයට 20 ක අත්තිකාරම් මුදල් වටිනාකම වූ රු.3,750,667 ක් පෙර ගෙවුම් ගිණුම හර කිරීම වෙනුවට ණයගැති ගිණුම හර කර තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම
-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු අත්තිකාරම් ශේෂය රු.1,143,183 ක් වූ අතර, එම මුදලින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පවතින රු.910,450 ක මුදලක් හඳුනාගෙන නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂය වනවිටත් වැඩ අවසන් කර තිබූ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අයකර ගත යුතු රු.12,405,308 ක් වටිනා ණයගැති ශේෂය 2015 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගෙන නොතිබූ අතර, මෙම මුදල මුළු ණයගැති ශේෂයෙන් සියයට15 ක් ඉක්මවා තිබුණි.

(ඇ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු එකතු කළ අගය මත බදු රු.1,194,194 ක් නිරවුල් කිරීමකින් තොරව 2012 වර්ෂයේ සිට ගිණුම්වල දක්වා තිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.
-------------------------------------

එකතුව රු. 75,025,657 ක්වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට අයත් ග්‍රාමීය මාර්ග පවරා ගෙන ඒ බව ගැසට් මගින් නිවේදනය කල යුතු වූවත්, ප්‍රාදේශීය සභාවට අයත් ග්‍රාමීය මාර්ග පවරා ගැනීම සඳහා 1993 න් පසු කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 193 වගන්තිය ප්‍රකාර අයවැයගත මුල්‍ය ප්‍රතිපාදන හා පරිපූරක සමඟ සසඳා බලා එක් එක් වියදම් විෂයය යටතේ ඇති අතිරික්තයන් හා ඌණතාවයන් පිළිබඳ විචලනය පැහැදිලි කරන ප්‍රකාශයක් අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කොට නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 218 වගන්තිය ප්‍රකාර සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ සමීක්ෂණ මණ්ඩලයක් මගින් පරික්ෂා කරවීමට සභාපතිවරයා විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනතට අනුව 1983 වර්ෂයේ සිට රාජ්‍ය සේවයට බැඳුනු සෑම සේවකයෙක්ම වැන්දඹු අනත්දරු අරමුදලට දායක විය යුතුය, සභාව විසින් ඒ සඳහා යොමුකර අදාළ අංකය ලබා ගැනීමෙන් පසු මාසික දායක මුදල් යැවීමට කටයුතු කළයුතු වුවත්, සේවකයින් 51 දෙනෙක් සඳහා අංක ලබා නොගෙන රු.2,523,842 ක දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යවා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.3,234,068 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු18,673,995 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
--------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම්
-------------------------------------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
|---|---|---|---|---|
| | | '000 රු. | '000 රු. | '000 රු. |
| (i) | වරිපනම් හා වරෙන්තු ගාස්තු | 20,077 | 22,098 | 10,510 |
| (ii) | බදු කුලී | 3,084 | 3,433 | 107 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,735 | 1,710 | - |
| (iv) | වෙනත් ආදායම් | 9,211 | 10,265 | 158 |
| | **මුළු එකතුව** | **34,107** | **37,506** | **10,775** |

2.2.2 වරිපනම් බදු
--------------

2016 ජුනි 30 දිනට රු.7,419,414 ක්වූ වරිපනම් බදු අයවීමට තිබුණි.

2.2.3 කර්මාන්ත හා ව්‍යාපාර බදු

-------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත හා ව්‍යාපාර බිහිවීමේ වර්ධනයක් වාර්තා වන අතර, ඊට සාපේක්ෂව මෙම ආදායම් ප්‍රභවයේ වැඩිවීමක් දක්නට නොලැබුණි.. 2013 වර්ෂයේ 1696 ක් වූ ඒකක සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් ඉදිරි වර්ෂවල අඩුවීමක් පෙන්නුම් කෙරුණු අතර, ප්‍රදේශයේ ස්ථානීය පරීක්ෂාවක් කර ඒකක හඳුනාගැනීමටද පියවර ගෙන නොතිබුණි.

2.2.4 කඩකුලී

---------

(අ) 2005 සිට උඩුගම්පොළ වෙළඳසැලක් කුලියට දීමෙන් හිඟව පවතින මුදල රු.32,376 ක්වූ මුදල අයකර ගැනීමට 2009 වර්ෂයේ දී ලබාදුන් නඩුවේ තීරණය අනුව කොටස් වශයෙන් අයකිරීමට තීන්දු කර තිබුණද, මෙතෙක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) උඩුගම්පොළ කඩ කාමර සංකීර්ණයේ ඉහළ මාලයේ කඩ කාමර 8 ක් 2012 දෙසැම්බර් 09 දින සිට අළුත්වැඩියා කොට කුලියට දීමට පියවර ගෙන නොතිබුණි.

2.2.5 සම්ප්‍රේෂණ කුළුණු ආදායම්

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුළ ඇති සම්ප්‍රේෂණ කුළුණු සියල්ල හඳුනාගෙන 2009 අප්‍රේල් 17 දින අංක 1597/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය පරිදි ගාස්තු අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ආ) උඩුගම්පොල උප කාර්යාල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති සම්ප්‍රේෂණ කුළුණු 14 ක් හඳුනාගෙන තිබුණු අතර කුළුණු 09 කින් මෙතෙක් ගාස්තු අයකර ගෙන නොතිබුණි. මාබෝදල උප කාර්යාල ප්‍රදේශය තුළ කුළුණු 11 ක් හඳුනාගෙන තිබුණද, එක් කුළුණකින් අයකර ඇත්තේ රු.1,000 ක් වැනි සුළු මුදලක් විය.

(ඇ) පත්තඩුවන උප කාර්යාලයේ සම්ප්‍රේෂණ කුළුණු හයකින් ඉකුත් වර්ෂයන්ට අදාලව රු.187,858 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දිනට හිඟව පැවතුණි.

2.2.6 සතිපොළ ආදායම

-------------------------

උඩුගම්පොළ සතිපොළ 2009 න් පසුව කුලියට දීම සඳහා ටෙන්ඩර් කිරීමක් සිදුකර නොතිබුණි.

2.2.7 වෙනත් ආදායම්

--------------------

බටපොත ජල යෝජනා ක්‍රමයේ ජල පාරිභෝගිකයින් හතර දෙනෙකුගෙන් 2014-2015 කාලයට හිඟ මුදල්වූ රු.20,495 ක් අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1988 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ වසර 5 ට වැඩි රු.15,982,946 ක්වූ තැන්පත් ශේෂය, 2015 ඔක්තෝබර් 20 දක්වා ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. වසර 05 ට වැඩි උසාවි දඩ රු.69,800 ක මුදලක් ආදායමට නොගෙන තැන්පත් ලේඛණයේ රඳවා ගෙන තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ පවතින වෙන්දේසි ඉඩම්වලින් සභාවට පවරාගත් කොටස් වලින් පොදු කටයුතු සඳහා භාවිතා කිරීමට සුදුසු තත්ත්වයේ නොමැති ඉඩම් කොටස් 19 ක් විය.

(ඇ) අවුරුදු 05 ඉක්මවා තිබූ නිරවුල් නොකළ අත්තිකාරම් ශේෂය රු.920,450 ක් විය.

(ඈ) සභාවේ ජංගම බැංකු ගිණුම් දෙක තුළ සමාලෝචිත වර්ෂය තුල පැවති මාසික ශේෂයන්ගේ සාමාන්‍ය රු.28,051,209 ක් වී තිබුණි. මෙම අතිරික්ත මුදල් කාලීන තැන්පතු මත ආයෝජනය කිරීමෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායම සභාවට අහිමිවී තිබුණි.

(ඉ) 2014 මාර්තු 15 හා 2014 මැයි 23 පසළොස්වක පෝදා වැඩසටහන් සඳහා සුදුරෙදි මීටර් 5,000 ක් මිළට ගෙන තිබූ අතර, මිටර් 2540 ක් 2014 දෙසැම්බර් 02 දින බෙදාදී තිබුණි. වටිනාකම රු.492,000 ක් වූ ඉතිරි රෙදි මීටර් 2,460ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය පුරාම බෙදා හැරීමකින් තොරව 2016 මැයි 10 වන විටත් ගබඩාවේ රඳවා තිබුණි.

3.2 ඉඩම් අනු කොටස්වලට බෙදීමේ සැලසුම් අනුමත කිරීම.

-----------------------------------------------------------------

සභාව විසින් ඉඩම් අනුබෙදුම් සැලසුම් සඳහා අනුමැතිය දීමේදී ලබාගත් ආදායම් නියැදියක් පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) පොදු පහසුකම් සඳහා වෙන්කර ඇති රූඩ් 01 පර්චර්ස් 111.61 ක්වූ ඉඩම් කට්ටි 04 ක් සඳහා ඉඩම් ඔප්පු විගණිත දිනයවූ 2015 නොවැම්බර් 20 දින වන විටත් සභාවට ලැබී නොතිබුණි.

(ආ) අනු බෙදුම් සැලසුම් අනුමත කිරීමේදී ඉඩමේ වටිනාකමින් සියයට 01 ක් සභාව විසින් අයකර තිබූ අතර, ඉඩමේ වටිනාකම රු.47.551,700 ක්වූ ඉඩම් කට්ටි 05 ක් තක්සේරු කිරීම ආදායම් පරීක්ෂකගේ තක්සේරුව මත සිදුකර තිබූ අතර ඉඩමේ වෙන්දේසි වටිනාකම සැලකිල්ලට ගෙන නොතිබුණි.

3.3 කෘෂිකර්ම විද්‍යා හා තාක්ෂණය පිළිබඳ වැඩමුළුව -ඊශ්‍රායලය

-----------------------------------------------------------------

2015 මාර්තු 05 සිට 2015 මාර්තු 13 දින දක්වා ඉහත වැඩමුළුව සඳහා සහභාගීවීමට නාගරික සභිකයින් 21 දෙනෙකු වෙනුවෙන් රු.5,118,876 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි.

මෙම සංචාරයෙන් ලබාගන්නා දැනුම අත්දැකීම් හා අවබෝධය සභාවේ සේවාවන් වැඩිදියුණුවට අදාල කරගත හැකි බව සභා ලේකම් විසින් කරුණු දක්වා තිබුණද, විදේශ ගමන අවසන් කර දින 60 කදී එනම් 2015 මැයි 15 දින සභාව විසුරුවා තිබුණි. එසේ හෙයින් මෙම සංචාරය සඳහා වියදම් ලෙස දැක්වෙන රු.4,875,120 ක මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය. මෙම සංචාරයෙන් පසු නගර සභා සභිකයින් විසින් බලප්‍රදේශයේ ජනතාවට ලබාදුන් සේවාවන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

3.4 ව්‍යාපෘති ප්‍රමාද කිරීම
------------------------

2013 වර්ෂයේ බස්නාහිර පළාත් සභාවේ පරිපූරක ඇස්තමේන්තු මගින් කොටුගොඩ ආදාහනාගාරය ඉදිකිරීම සඳහා රු.8,655,000 ක ඇස්තමේන්තුවක් අනුමත වී තිබුණි. මෙයින් රු.1,360,967 ක් 2014 ජනවාරි 20 දිනත්, රු.7,294,032 ක් 2015 ජනවාරි 28 දිනත් ප්‍රාදේශීය සභාව වෙත ලැබී තිබුණි. 2013 නොවැම්බර් 12 දින ගිවිසුම අනුව රු.6,804,838 ක මුදලකට මෙම කොන්ත්‍රාත්තුව භාරදී සමාලෝචිත වර්ෂයේ 7,621,419 ක් ණයහිමියන් ලෙස දක්වා තිබුණද , 2014 වර්ෂයේ ලැබී තිබූ මෙම මුදල රඳවා ගැනිම සඳහා 2015 වර්ෂයේ පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

2015 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලයට කසළ අපහරණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.8,096,292 මුදලක් වැයකර තිබුණි. ප්‍රාදේශීය සභාව වර්ග කිලෝ මීටර් 127.57 කින් සමන්විත වන අතර, ග්‍රාම සේවා වසම් 115 කින් යුක්ත විය. සභා බල ප්‍රදේශයේ දිනකට ටොන් 10-12 පමණ කසළ ජනනය වේ. ජනනය වන කසල ප්‍රමාණයෙන් දිනකට කසල ටොන් 6 ක් පමණ ඉවත් කර තිබුණි. ඉන් දිරන කසල ටොන් 4-5 ක් වන අතර, නොදිරන කසල ටොන් 01 ක් පමණ විය. පෞද්ගලික ඉඩම් කීපයකට මෙම දිරන කසල ප්‍රාදේශීය සභාවෙන් වලවල් කපා බැහැර කලද, ඒ සඳහා පරිසර අධිකාරියෙන් නිකුත් කරන ලද පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

3.6 අයවැය පාලනය
--------------------

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 62 ක් යටතේ ඇස්තමේන්තු කර තිබූ රු.57,286,300 ක් වූ ප්‍රතිපාදන සියයට 100 ක් ඉතිරිවීම හේතුවෙන් අයවැය ලේඛණය ඵලදායී පාලක කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

3.7 කාර්ය සාධනය.
-------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය ඇතුලත් වන ලෙස සංයුක්ත සැලැස්මක් සකස් කොට නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ළඟා කරගත යුතු ක්‍රියාකාරකම් 71 ක් 2015 වර්ෂය අවසානයේදීද ළඟා කරගෙන නොතිබුණි.

(ඇ) සිව් අවුරුදු සැලැස්ම අනුව 2014 වර්ෂයේ යෝජනා කර ඇති ඇස්තමේන්තු මුදල රු.20,900,000 ක් වූ ව්‍යාපෘති යෝජනා 08 ක් 2015 වර්ෂය අවසානය දක්වාම ඉටුකර නොතිබුණි.

4. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) අභ්‍යන්තර විගණනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය